// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1974/6 - 2016 ජුලි මස 04 වැනි සඳුදා - 2016.07.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට විසල් කුරුණෑගල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ යන්තම්පලාව අපජල පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 ජූනි මස 22 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1223.

### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 832, කුරුණෑගල නගරය - ගංගොඩ වසම ග්‍රාම නිලධාරී වසමේ විල්ගොඩ ගමේ පිහිටි කුඹල්කොටුවේ වත්ත නමැති ඉඩමේ සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 14 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | පුවක්ගස් හන්දිය සිට යන්තම්පලාව දක්වා වැටී ඇති මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) හා අංක 543 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 6B හි කොටසක් ; |
| *නැගෙනහිරට* | : | අංක 543 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 6B හි කොටසක් ; |
| *දකුණට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස හා ලීල් රවීන්ද්‍ර මුණසිංහ හිමිකම් කියන ඉඩම ; |
| *බටහිරට* | : | පුවක්ගස් හන්දිය සිට යන්තම්පලාව දක්වා වැටී ඇති මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) හා මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : සන්රි ඇඩ්වර්ටයිසින් සර්විස් ප්‍රයිවට් ලිමිටඩ්,
අංක 301, පුත්තලම් පාර,
කුරුණෑගල.

07 - 810

1A - G 23771 — 12 (2016/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*